# බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය

## 5.1 කියවීම් පත්‍රිකාව

රාජාණ්ඩු පාලන සමයේ දී සාම්ප්‍රදායික සමාජ ආර්ථික ක්‍රමය ඇසුරෙන් ගොඩනැගුණු සමාජ ක්‍රමයක් මෙරට පැවතුණි ,මෙම සමාජය තුළ ප්‍රභූ පන්තියක් සිටි අතර එම පිරිස රටේ ජනගහනයෙන් ඉතා සුළු පිරිසකි .ප්‍රභූ පන්තියේ බොහෝ විට රටේ පරිපාලන කටයුතු මෙහෙයවා ඇත .රටේ බහුතර ජනතාව සාමාන්‍ය ජනයා වූ අතර ඔවුහු කෘෂිකර්මාන්තය මත යැපුන හ.මෙරට සම්ප්‍රදායික ජන ජීවිතය ගම මූලික කරගෙන බිහිව තිබුණි. එය ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් ලෙස හැඳින්වේ. එකල සමාජයේ අන්‍යෝන්‍ය සහයෝගය හා සහජීවනය පැවති අතර ශ්‍රමය ලබා ගත්තේ අත්තම් ක්‍රමයටය. මුදල් භාවිතය අවම වී තිබුණි .ගම්වැසියන්ගේ සුළු ආරවුල් හා සුළු පැමිණිලි විභාග කරන ලද්දේ ගම්සභා විසිනි එසේම ගමේ ඇළවේලි සැකසීම වැව් අමුණු නඩත්තුව පාරවල් හා විහාර වෙහෙර විහාර තැනවීම වැනි පොදු කටයුතු මෙහෙයවීමට දී ගම් සභාවට වැදගත් තැනක්සම්ප්‍රදායික රාජකාරි ක්‍රමය යටතේ ගම් සභාවට අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීම සිදුවිය .1505 පෘතුගීසීන් මෙරටට පැමිණ වෙළඳාම කෙරෙහි වැඩ වැඩි අවධානයක් යොමු කිරීම නිසා ඔවුන් යටතේ පැවති ප්‍රදේශ වල කෘෂිකාර්මික කටයුතු තරමක් අඩපණ විය .ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි බලය පැවති සමයේ ලන්දේසීන්අපනයනය ඉලක්ක කරගෙන කුරුඳු ගම්මිරිස් ආදිය වගා කිරීමේ ක්‍රමයක් අනුගමනය කළහ .එසේම ලන්දේසීන් සුළු කර්මාන්ත කිහිපයක් ආරම්භ කරමින් නිම කරන වැඩ කොටසට ගෙවීම් කරන වැටුපට සේවය කරන කම්කරු සුළු පිරිසක් බිහිවීම සිදුවිය.ලන්දේසීන්ට පසුව ලංකාවට පැමිණි බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාවම ඔවුන්ගේ පාලනයට පත් වීමත් සමග සම්පූර්ණයෙන්ම ලංකාවේ සමාජ ආර්ථික තත්වය වෙනස් කිරීමට සුදුසු පසුබිමක් ඔවුන් කෝල්බෘක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වා දෙනු ලැබූ වතු වගාව සමඟ සිදුවිය .ඒ අනුව බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවේ ප්‍රථමයෙන් කෝපි වගාවෙන් ආරම්භකොට පිළිවෙලින් කොකෝවා හා සිංකෝනා තේ පොල් රබර් වතු වගා ආරම්භ කරන ලදී .